සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

**සැලකිය යුතුයි:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- **පහත දැක්වෙන ගී සහ පද්‍ය පාඨ ආශ්‍රයෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) හැංගි හොරා කියමින් හඬ දෙන්නේ
ඒ ඇහිලයි මම එළියට පැන්නේ
දනිච් යකුනි තොපි මට කවුද කියන්නේ
මේ වනයට මම පතිනිය වන්නේ

(2) බොල මෝඩයෝ... තුන්වෙනි පාදය කියන්නේ මේ ශ්ලෝකයේ තුන්වෙනි පාදය (පැංචාට යලිත් ගසන්නට යයි.)

(3) වලට ගොස් ම පියාණෙනි උතුම්
කිසි දිනක පෙරළා නොආවොත්
මේ ලෙනේ සිරවී සිටින්නා
බැහැර යන්නට මඟ නොදන්නා

(4) ඔන්න මම තේ වතුර වක්කරගෙන ආහම
මේ මහත්තරු එක්කෙනෙක්වත් නෑ. තේ බොන්න මතක නැතිව ඇවිදින්ඩ යන්ඩ ඇති.

(01) (1) පද්‍ය අයත් වන්නේ,
(1) ගම්මඩුවට ය. (2) දෙවොල් මඩුවට ය.
(3) බෙරහඬ නාට්‍යයට ය. (4) සන්නි යකුමට ය.

(02) මහාචාර්ය M. H. ගුණතිලකයන්ගේ නාට්‍යයක කොටසක් වන්නේ,
(1) 1 ය. (2) 2 ය. (3) 3 ය. (4) 4 ය.

(03) (3) පද්‍යය අයත්වන කලා නිර්මාණය වන්නේ,
(1) වෙස්සන්තර නාට්‍යය (2) විදුර නූර්තිය
(3) සිංහබාහු නාට්‍යය (4) කුවේණි නාට්‍යය

(04) (4) සංවාද ඛණ්ඩය අයත් වේදිකා නාට්‍යය
(1) බෙරහඬ (2) තවත් උදෑසනක්
(3) ජනේලය (4) මනරංජන වැඩවර්ජන

(05) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යයක සංවාද කොටසක් වන්නේ,
(1) 1 ය. (2) 2 ය. (3) 3 ය. (4) 4 ය.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

(06) නාට්‍යයක් වේදිකාගතවන විට එහි මූලිකත්වය හිමි වන්නේ
(1) රූපණ ශිල්පීන්ට ය. (2) වේදිකා පාලකවරයාට ය.
(3) රංගාලෝක ශිල්පියාට ය. (4) අධ්‍යක්ෂවරයාට ය.

(07) පරිවර්තන අනුවර්තන, ස්වතන්ත්‍ර යන ප්‍රභේද තුනට අයත් වන්නේ,
(1) සකුන්තලා, බෙරහඬ, පුත්‍ර සමාගම (2) රත්නාවලී, කපුවා කපෝති, බෙරහඬ
(3) කරදිය, දෙපානෝ, මානසවිල (4) සකුන්තලා, බෙරහඬ, කරදිය

(08) රංග වින්‍යාසකරු මූලිකවම අවධානය යොමු කළ යුතු වන්නේ,
(1) රූපණ ශිල්පීන් පිළිබඳව ය.
(2) නාට්‍යයේ දෘෂ්ටිය පිළිබඳව ය.
(3) රංග ශෛලිය පිළිබඳව ය.
(4) වේදිකාවේ හිස් අවකාශය නිර්මාණශීලී ලෙස භාවිතා කිරීම පිළිබඳව ය.

(09) නාට්‍ය ධර්මී නාට්‍යයක ලක්ෂණයක් වන්නේ,
(1) ස්වභාවික තත්වයට ආසන්න ස්වරූපයෙන් වේදිකාව මත අභිනයන් හැසිරවීමයි.
(2) ස්වභාවික ආකාරයට ම වේදිකාව මත හැසිරීමයි.
(3) අතිශයෝක්තියට නගා රූපණය ඉදිරිපත් කිරීමයි.
(4) කලින් සම්මත කරගත් ආකාරයට වේදිකාව මත සතර අභිනය හැසිරවීමයි.

(10) වේදිකාවේ ඇති සුදු වර්ණයෙන් යුතු ද්‍රව්‍ය පමණක් පෙන්වන ආලෝක පහන වනුයේ,
(1) යොමු පහන ය. (2) ධාරා පහන ය.
(3) අල්ට්‍රා වයලට් පහන ය. (4) ක්ෂණ පහන ය.

(11) හොඳම නළුවකුගේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ,
(1) අධ්‍යක්ෂවරයාගේ අර්ථකතනය තේරුම් ගැනීමයි.
(2) රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා මනාව පුහුණු කිරීමයි.
(3) පරිකල්පන ශක්තිය මත චරිතයේ ඇති විවිධ භූමිකා වෙනස් කරමින් රූපණය කිරීමයි.
(4) පුහුණුවීම් සඳහා අඛණ්ඩව නියමිත වේලාවට සූදානමින් පැමිණීමයි.

(12) ශ්‍රී ලංකාවේ අවසන්වරට පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උළලේ හොඳම නාට්‍ය ලෙස තෝරාගනු ලැබුවේ,
(1) ගිරිකූට කාශ්‍යප (2) ප්‍රේමවන්ත කුමාරයෝ
(3) නැතිව බැරි මිනිහෙක් (4) සිල්ගත් බිල්ලෝ

(13) සුසාධිත නාට්‍යයක් යනුවෙන් හඳුන්වන්නේ,
(1) ලෝකධර්මී නාට්‍යයකි.
(2) ගැටුමක් අවශ්‍ය නැති නාට්‍යයකි.
(3) මුල මැද අග පැහැදිලිව ඇති නාට්‍යය කි.
(4) සංවාද අතර සංගීතමය රිද්මයක් ඇති නාට්‍යය කි.

- **පහත දැක්වෙන්නේ මධ්‍යපාත විද්‍යාලයේ කලා උළෙලේ ඉදිරිපත් කළ ප්‍රාසංගික අංග කිහිපයකි.**

| | | | |
|---|---|---|---|
| (අ) | ලී කෙළි | (ආ) | ශුද්ධ මාත්‍රා |
| (ඇ) | වඩිග පටුන | (ඈ) | රාධා ක්‍රිෂ්ණා නර්තනය |
| (ඉ) | නානු මුරය | (ඊ) | සවරං නැටුම |

(14) ඉහත අංග අතුරින් නෘත්ත ගණයට අයත් වන්නේ,
(1) අ, ආ, ඇ (2) ඇ, ඈ, ඉ (3) අ, ආ, ඊ (4) ආ, ඉ, ඊ

(15) උක්ත අංග අතුරින් නෘත්‍ය ගණයට ගැනෙනුයේ,
(1) අ, ආ, ඇ (2) ඇ, ඈ, ඉ
(3) ඇ, ඉ, ඊ (4) ආ, ඈ, ඊ

(16) යම් නාට්‍යමය අවස්ථාවක් හඳුනාගත හැක්කේ,
(1) ඒ තුළ දෙගිඩියාවක් ඇති හෙයිනි.
(2) රංගාවතරණය වන අවස්ථාවක් ලෙසිනි.
(3) කුතුහලයක් නිර්මාණය වූ අවස්ථාවක් ලෙසිනි.
(4) නාට්‍යයේ ගැටළුවක් සමඟ ගැටුමකට තුඩු දෙන අවස්ථාවක් ලෙසිනි.

(17) නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී,
(1) චරිත පැහැදිලි ලෙස අර්ථකතනය විය යුතුය.
(2) අදාල රංග විධාන ලියා තැබිය යුතුය.
(3) ලිඛිත භාෂාව භාවිත කළ යුතුය.
(4) සංවාද භාවිතය මූලික වේ.

(18) නළුවරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණක් නොවන්නේ,
(1) ලියන ලද නාට්‍ය පෙළට ගැලපෙන පරිදි නළු නිළියන් තේරීම කළ යුතුය.
(2) කඩවසම් පුද්ගලයන් තෝරා ගැනීමෙන් නිෂ්පාදනය සාර්ථක කරගත හැකිය.
(3) නාට්‍යයේ තේමාවට ගැලපෙන ලෙස තේරීම කළ යුතුය.
(4) පිටපතෙන් කියවෙන යුගයට ගැලපිය යුතුය.

(19) වේෂභූෂණ නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,
(1) නාට්‍යය ශෛලිය සහ ඉන් මතුකරන මනෝභාවය
(2) රට ප්‍රදේශීය සහ සංස්කෘතිය
(3) පෙළෙහි එන චරිතවලට උචිත වීම.
(4) අලංකාර සහ වර්ණවත් භාවය

(20) අංග රචනය කිරීමේ දී ශිල්පියෙක් අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණක් නොවන්නේ,
(1) චරිතවල බාහිර ස්වරූපය පමණක් නොව අභ්‍යන්තර චරිත ලක්ෂණ ද මතු කළ යුතු බව.
(2) නළුවාගේ හෝ නිළියගේ මුහුණු අලංකාර කිරීම ප්‍රධාන දෙයක් බව.
(3) පෙළෙහි ශෛලියට අනුකූලව අංග රචනා කිරීම අවශ්‍ය වේ.
(4) චරිතය නිරූපණය කරන පුද්ගලයාගේ සමේ වර්ණය මුහුණේ හැඩය අංග රචනය සඳහා බලපාන කරුණකි.

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.**

(21) දික්තල කාලගෝල නාට්‍යය සඳහා පදනම් වූ කථා ප්‍රවෘත්තිය තෝරා ගන්නා ලද්දේ,
(1) චුල්ලධනුද්ධර ජාතකයෙනි (2) මහා වංශයෙනි.
(3) උම්මග්ග ජාතකයෙනි. (4) රාමායනයෙනි.

(22) සයික්ලොරාමාව හෙවත් ගගනිකාව ආලෝකමත් කිරීමට යොදා ගන්නා පහන් වර්ගය වන්නේ,
(1) යොමු පහන (2) ධාරාලෝක පහන
(3) අනුගාමි තිත් පහන (4) ඩීමරය

(23) වර්ණ පිලිබඳව වඩාත් අවධානය යොමු කරන ශිල්පීන් වන්නේ,
(1) රංගාලෝක, පසුතල, රංග වස්ත්‍ර, අංගරචන
(2) රංගෝපකරණ පසුතල, දර්ශන, පිටපත් රචක, අධ්‍යක්ෂ
(3) රංගෝපකරණ, රංගාලෝකය, සංගීතය, රංගවස්ත්‍ර
(4) වෙස් මෝස්තර, පසුතල, රංග වින්‍යාසය, රංග වස්ත්‍ර

(24) ශිථිලකරණ අභ්‍යාස මගින් ඉටුවන කාර්ය වනුයේ,
(1) නළු ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට හැකි වීමයි.
(2) අවයවයන්ගේ හා ශරීරයේ සැහැල්ලු බව ලබා දීමයි.
(3) මානසික සමබරතාවය ඇති කර ගැනීමට හැකි වීමයි.
(4) කටහඬ මැනවින් ප්‍රක්ෂේපණය කර ගැනීමට හැකි වීමයි.

(25) උරුට්ටුව නැමැති සංගීතාංගය ජනිත වූ ජන නාටකය,
(1) ටවර්හෝල් නාට්‍යයේ ය. (2) සොකරි නාටකවලය
(3) නාඩගම් වලය (4) මිනර්වා නාට්‍යයේ ය.

- පහත සඳහන් වගුව ඇසුරෙන් ප්‍රශ්න අංක 26 සිට 29 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| පාලි නැටීම<br>සුනියම් යක්ෂනියගේ වේෂත්‍රය<br>සන්නියකුන් පැමිණීම<br>පැදුරේ දපවිල්ල | අඹ විදමන<br>මරා ඉපැද්දවීම<br>රාම මැරීම<br>ඇත් බන්ධන | උඟුරායක්කම<br>ගබඩා කොල්ලය<br>ගුරුගේ මාලාව<br>මුවමල විදීම | දොලහ පෙළපාලිය<br>කපුයක්කාරිය<br>දරු නැලවිල්ල |

(26) උඩරට ශාන්තිකර්මයක් වන කොහොඹා කංකාරියේ රංග අවස්ථා දක්වෙන තීරුව වන්නේ,
(1) A (2) B (3) C (4) D

(27) පත්තිනි දෙවියන් හා සම්බන්ධ කථා ඇතුළත් තීරුව වන්නේ,
(1) A (2) B (3) C (4) D

(28) අනුරූපණ අවස්ථා බහුලව නිරූපණය වන නාට්‍යමය පෙළපාලි ඇතුළත් තීරුව වන්නේ,
(1) AB (2) AD (3) BC (4) BD


(29) සශ්‍රීකත්වය හා සෞභාග්‍යය අරමුණු කරගත් ශාන්තිකර්මවල නාට්‍යමය ජවනිකා ඇතුළත් තීරු වන්නේ,

(1) AB (2) BD (3) CD (4) BC

- **පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් ප්‍රශ්න අංක 30 සිට 34 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



ක



ග



ජ



ට

(30) මෙහි ''ක'' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ,

(1) සුමින්ද සිරිසේන ය. (2) නීල් අලස් ය.
(3) සුගතපාල ද සිල්වා ය. (4) හෙන්රි ජයසේන ය.

(31) මෙහි ''ග'' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ,

(1) සයිමන් නවගත්තේගම ය. (2) ආර්. ආර්. සමරකෝන් ය.
(3) බන්දුල විතානගේ ය. (4) ජයලත් මනෝරත්න ය.

(32) ''වීදි රැජින'' ලෙස විරුදාවලි ලත් වීදි නාට්‍ය ශිල්පිනිය දැක්වෙන ඡායාරූපය වන්නේ,

(1) ''ක'' ය. (2) ''ග'' ය. (3) ''ජ'' ය. (4) '' ට'' ය.

(33) ''කැළණි පාලම'' නාට්‍යයේ මැටිල්ඩාගේ චරිතය නිරූපණය කරන ශිල්පිනිය දැක්වෙන ඡායාරූපය වන්නේ,

(1) ''ක'' ය. (2) ''ග'' ය. (3) ''ජ'' ය. (4) '' ට'' ය.

(34) දෛනික ජීවන ප්‍රශ්න ජනේලය නාට්‍යය මගින් ඉදිරිපත් කළ නාට්‍යකරු දැක්වෙන ඡායාරූපය වන්නේ,

(1) ''ක'' ය. (2) ''ග'' ය. (3) ''ජ'' ය. (4) '' ට'' ය.

(35) නාට්‍ය පිටපතෙහි ඇති කථාව ප්‍රේක්ෂකයාට ප්‍රදර්ශනය වන්නේ,

(1) පෙළ මගිනි (2) චරිත මගිනි (3) සංවාද මගිනි (4) අභිනය මගිනි

(36) අභිරූපණයේ දී මුහුණ අංග රචනය කරනු ලබන්නේ,

(1) ප්‍රේක්ෂකයාට රස භාවය ජනිත වන පරිදිය.
(2) රංග වස්ත්‍රාභරණ වලට ගැලපෙන පරිදිය.
(3) චරිතයෙන් මතුවන පරිදි මුහුණේ උපාංග ඉස්මතුවන පරිදිය.
(4) තාත්වික රංගනයකට සුදුසු පරිදිය.

(37) නාට්‍ය සංගීතය

(1) ආහාර්ය අභිනයට අයත්ය. (2) වාචික අභිනයට අයත්ය
(3) සාත්වික අභිනයට අයත්ය (4) ආංගික අභිනයට අයත්ය.

(38) ආගමික හා ජාතික වශයෙන් හැඟීම් ඇති කිරීම සඳහා ලාංකික ඉතිහාසය හා ජන ප්‍රවාද ඇසුරෙන් රචිත නූර්ති නාට්‍ය වන්නේ,

(1) රොලීනා, සිරිසඟබෝ (2) දස්කොන්, නාගානන්ද

(3) පද්මාවතී, දුටුගැමු ණු (4) සිරිසගබෝ, දුටුගැමුණු

(39) හොඳින් වින්‍යාස කරන ලද හරවත් සරල තනි දර්ශනයකින් යුත් නාට්‍යය,

(1) ළමා නාට්‍ය වේ. (2) කෙටි නාට්‍ය වේ.

(3) ථියටර් නාට්‍ය වේ. (4) මිනර්වා නාට්‍ය වේ.

(40) දඹදිව සේරිමාන් රජු ගෝනෙකුට විද මැරූ උපත් කතාව ඇතුළත් ශාන්ති කර්මය වන්නේ,

(1) ගම්මඩු ශාන්තිකර්මයයි.

(2) කොහොඹා කංකාරිය ශාන්ති කර්මයයි

(3) පහන්මඩු ශාන්තිකර්මයයි.

(4) දහ අට සන්නි ශාන්ති කර්මයයි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් Western Province Education Department Western Province மேல் மாகாணக் கல்வித் திணைக்களம்

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

**සැලකිය යුතුයි:**

- පළමු ප්‍රශ්ණය අනිවාර්ය වේ.
- පළමුවෙනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04ක් ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

(01) (1) විකෘති නාට්‍යයෙහි ප්‍රධාන තේමාව කුමක් ද? (ලකුණු 02)

(2) මෙම නාට්‍යයෙහි දැකිය හැකි නාට්‍යධර්මී ලක්‍ෂණ දෙකක් පෙන්වා දෙන්න. (ලකුණු 02)

(3) මෙම නාට්‍ය ස්වතන්ත්‍ර නාට්‍යයක් යනුවෙන් හඳුන්වන්නේ මක් නිසා ද? (ලකුණු 02)

(4) සරත් සූරසේනයන් මෙම නාට්‍යය සඳහා දායක වී ඇත්තේ කුමන අංශයෙන් ද? (ලකුණු 02)

(5) මෙම නාට්‍ය ජවනිකා කීයකට බෙදා තිබේ ද? පළමු ජවනිකාව නම්කර ඇත්තේ කුමන නමකින් ද? (ලකුණු 02)

(6) මෙම නාට්‍යයෙන් කියවෙන නාට්‍ය කරුවාගේ දෘෂ්ටිය කුමක් ද? (ලකුණු 02)

(මුළු ලකුණු 12)

(02) (1) නාට්‍ය පෙළක් රංගනයක් බවට පත් කිරීමේ දී අධ්‍යක්‍ෂවරයෙකු අවශ්‍ය වන්නේ මන්ද? (ලකුණු 03)

(2) නාට්‍ය රචක සහ අධ්‍යක්‍ෂ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 03)

(3) නාට්‍ය පෙළක් අධ්‍යක්‍ෂණය කිරීමේ දී අනුගමනය කරන ක්‍රම ශිල්පයන් ලැයිස්තු ගත කරන්න. (ලකුණු 06)

(03) (1) රංග ක්‍රීඩා යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? (ලකුණු 03)

(2) ඔබ දන්නා රංග ක්‍රීඩා හතරක් නම් කරන්න. (ලකුණු 04)

(3) රංග ක්‍රීඩාවන්හි යෙදීමෙන් නළුවාට ඇති ප්‍රයෝජන මොනවා ද? (ලකුණු 05)

(04) (1) අංග රචනය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(2) අංග රචනා ද්‍රව්‍ය හතරක නම් ලියන්න. (ලකුණු 04)

(3) අංග රචනය නාට්‍යයේ සාර්ථකත්වයට බලපාන්නේ කෙසේ ද? (ලකුණු 05)

(05) (1) රංග භූමි වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(2) රංග භූමියේ නූතන භූගෝලීය බෙදීම ඇඳ දක්වන්න. (ලකුණු 04)

(3) රංග භූමියක් තුළ පැවතිය යුතු ලක්‍ෂණ පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06)



(1) මෙම ඡායාරූපයෙහි දැක්වෙන ශාන්තිකර්මය නම් කරන්න. (ලකුණු 02)

(2) එම ශාන්තිකර්මය පැවැත්වෙන ප්‍රදේශ දෙකක් නම් කර එහි දැකිය හැකි නාට්‍යමය පෙළපාලි දෙකක් දක්වන්න. (ලකුණු 04)

(3) ඔබ සඳහන් කල එක් නාට්‍ය පෙළපාලියක අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(07) පහත දැක්වෙන කථා සැකිල්ල ඔබ කැමති පරිදි අවසානයක් කරාගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

2018 වසරට තෝරාගත් ළමුන්ගේ නාම ලේඛනය ජාතික පාසලේ ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුල් වූ පසුව තිබෙන ප්‍රධාන පුවරුවක දමා ඇත. දෙමව්පියන් මහත් උනන්දුවකින් පොරකමින් එය කියවීමට උත්සාහ ගනී.

පාසල ආසන්නයේ ම පදිංචි වඩු කාර්මිකයෙකු වන සිරිපාලද ඒ අතර වේ. ඔහුගේ පුතාගේ නම එහි සඳහන් වී නැත. ඔහු කෝපයෙන් කළබලවී ඉතා වේගයෙන් විදුහල්පතිතුමාගේ කාර්යාලය දෙසට පා නගන අතර අසාධාරණයට ලක් වූ තවත් තරබාරු ගැහැණුන් දෙදෙනෙක් ද ඔහු පසු පස යයි............. එතැන් සිට

(1) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීම. (ලකුණු 04)

(2) සංවාද සහ රංග විධාන සහිතව පෙළ රචනා කිරීම. (ලකුණු 08)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Western Province Education Department Western Province Education Department

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | ප්‍රායෝගික පරීක්ෂණය |

සැලකිය යුතුයි:

- මෙම ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රය ඇගයීම් අංක 06කින් සමන්විත වන අතර ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 40% වනසේ අවසාන ලකුණු ගණනය විය යුතුය. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මුළු ලකුණු ගණන 100කි.

## ඇගයීම 01

පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල) කාලය විනාඩි 04

- ලෝක ධර්මී සංවාද සහිත පෙළ දෙකක්ද, නාට්‍ය ධර්මී සංවාද සහිත පෙළ දෙකක් ද ඇසුරෙන් මෙම ඇගයීම සිදු කරනු ලැබේ.
  (1) ශිෂ්‍යයා විසින් තෝරාගනු ලැබූ පුහුණු වී පැමිණෙන විකෘති හෝ දික්තලා කාලගෝල නාට්‍යයෙන් කොටසක්
  (2) ගුරුවරයා විසින් තෝරා දෙනු ලබන මනමේ නාට්‍යය හෝ තලමල පිපිලා නාට්‍යයෙන් කොටසක්

- ශිෂ්‍යයා විසින් පෙර පුහුණු වී පැමිණෙන සංවාද කොටසට ලකුණු 20ක් හා පරීක්ෂක මණ්ඩලය විසින් ලබාදෙන කොටසට ලකුණු 20ක් වශයෙන් ලකුණු 40ක් ප්‍රදානය කර 40 දෙකෙන් බෙදා සුදුසු ලකුණු ලබාදෙන්න.
  (1) කටහඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය = 5
  (2) චරිතය හා අවස්ථාවට අනුකූලවීම = 5
  (3) භාවාත්මක නිරූපණය = 5
  (4) ශාරීරික ප්‍රකාශනය = 5
  20

## ඇගයීම 02

ක්ෂණික නිරූපණය - කාලය විනාඩි 15

- නාට්‍යානුසාරී සිදුවීමක් ගොඩ නැංවීමට සුදුසු මාතෘකාවක් ලබා දෙන්න. දෙනු ලබන මාතෘකාවට ගුරු භවතා විසින් සුදුසු නාට්‍ය කොටසක් එකතුකර ශිෂ්‍යයාට ලබා දෙන්න.
  නිදසුන් : දේශපාලනඥයෙකු ඡන්දදායකයන් ඇමතීම.
  පරාජිත දේශපාලනඥයෙකු ඡන්දදායකයන් ඇමතීම.
- ක්ෂණික නිරූපණය (කේවල)
  (i) නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැගීම = 5
  (ii) කටහඬ හඬ ප්‍රක්ෂේපණය උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම = 5
  (iii) ශාරීරික ප්‍රකාශනය සහිත වීම. = 5
  15

## ඇගයීම 03

කෙටි නාට්‍ය නිෂ්පාදනය (සාමූහික)
කාලය විනාඩි 06 - 08 අතර වේ. ප්‍රමාණය සිසුන් 04 - 07 ක්.

- පන්ති කාමරයේ නිර්මාණය කරනු ලැබූ කණ්ඩායම් ක්‍රියාකාරකමක් වන අතර නාට්‍ය පෙළක් සහිත විය යුතුය.

| | | |
|---|---|---|
| (1) නාට්‍ය පිටපත (සිදුවීම් අවස්ථාවන්, සංවාද චරිත) | = | 5 |
| (2) ශාරීරික ප්‍රකාශනය සහ භාවිතය | = | 5 |
| (3) වේෂ භූෂණ නාට්‍යෝපකරණ සරල පසුතල රංග රචනය සහ සංගීතය/ හඬ භාවිතය | = | 5 |
| (4) කණ්ඩායම් සාමූහිකත්වය හා සූදානම | = | 5 |
| | | 20 |

## ඇගයීම 04

නාට්‍ය ගීතය (කේවල) කාලය විනාඩි 03

- ශිෂ්‍යයා අභිමත ඕනෑම නාට්‍ය ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කල යුතුය.

| | | |
|---|---|---|
| (1) සංගීතාත්මක බව හඬ පාලනය හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | = | 5 |
| (2) මනෝභාවික අන්තර්ගතය | = | 5 |
| (3) ශාරීරික ප්‍රකාශනය | = | 5 |
| | | 15 |

## ඇගයීම 05

නිර්මාණාත්මක රංග රචනය (සාමූහික)
කාලය විනාඩි 02 - 04 විය යුතුය.

- පූර්ව සූදානමක් සහිතයි. අපේක්ෂක ප්‍රමාණය 3 - 5 අතර වේ. රංග රචනය කේන්ද්‍රව සිදු කරනු ලබන නාට්‍යමය ඉදිරිපත් කිරීමකි. (අ. පො. ස සා. පෙළ විභාගය සඳහා අන්තර්ජාලයේ ප්‍රසිද්ධ කරන ලද සංගීත ඛණ්ඩ භාවිතයට ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.)

| | | |
|---|---|---|
| (1) සංගීත ඛණ්ඩයේ සුවිශේෂ ආකෘතික ලක්ෂණ හඳුනාගැනීම හා අර්ථකතනය | = | 5 |
| (2) මනෝභාවික අන්තර්ගතය | = | 5 |
| (3) ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | = | 5 |
| | | 15 |

## ඇගයීම 06

කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම.
කාලය විනාඩි 3 - 5 විය යුතුය.

- අපේක්ෂකයා තෝරාගත් සාම්ප්‍රදායික හෝ දෙස් විදෙස් ජනකතා, සුරංගනා කතා, උපමාකතා හෝ වෙනත් සුදුසු කතාවක් ඉදිරිපත් කල යුතුය.

| | | | |
|---|---|---|---|
| (1) | කතන්දරය තෝරා ගැනීම. ඒ පිළිබඳ මනා අවබෝධය | = | 5 |
| (2) | කටහඬ, හඬ ප්‍රක්ෂේපනය<br>උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ<br>යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම | = | 5 |
| (3) | ශාරීරික ප්‍රකාශනය රංග උපක්‍රම සහ අවකාශ භාවිතය | = | 5 |
| | | | 15 |